සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

2019.08.15 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

විභාග අංකය : ..........................

උපදෙස්:

* I කොටසේ 1 ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* 1 ප්‍රශ්නයේ ඇති **සියලු ම** අනුකොටස්වලට මෙම **ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.
* I කොටස, II කොටසේ පිළිතුරු පත් සමඟ **අමුණා** භාර දෙන්න.

## I කොටස

**1.** එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරා ගෙන, **එයට හිමි අංකය වරහන තුළ ලියන්න.**

1.1. සිංහල වර්ණ මාලාවෙහි එන 'ඕ' යන්න කුමන අක්ෂරයක් ද?
(1) කණ්ඨ තාලුජ (2) දන්තෝෂ්ඨජ (3) කණ්ඨජ
(4) කණ්ඨෝෂ්ඨජ (5) තාලුජ (......)

1.2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පෙළිය තෝරන්න.
(1) කන්කලු, වළාකුළු, දෘෂ්ඨිකෝණය, නිර්මාංස, නිස්සබ්ධ
(2) කන්කළු, වළාකුලු, දෘශ්ටිකෝණය, නිර්මාංෂ, නිශ්ශබ්ධ
(3) කන්කලු, වලාකුලු, දෘෂ්ඨිකෝණය, නිර්මාංශ, නිෂ්ශබ්ද
(4) කන්කළු, වලාකුළු, දෘෂ්ටිකෝනය, නිර්මාංස, නිශ්ශබ්ද
(5) කන්කලු, වලාකුළු, දෘෂ්ටිකෝණය, නිර්මාංශ, නිශ්ශබ්ද (......)

1.3. අකාරාදි පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පෙළිය තෝරන්න.
(1) පතෝල, වම්බටු, නිවිති, තම්පලා (2) කරවිල, පිපිඤ්ඤා, බෝංචි, මෑකරල්
(3) වට්ටක්කා, පුහුල්, දඹල, ගොටුකොළ (4) කතුරුමුරුංගා, කොහිල, තුඹ, තිබ්බටු
(5) කොස් ඇට, කංකුන්, කැරට්, මුකුණුවැන්න (......)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) වචනයක ආරම්භක අක්ෂරය සේ විසර්ගය යෙදේ.
(2) විසර්ගය ස්වරයකට පසු ව පමණක් යෙදේ.
(3) විසර්ගය ලිවීමේ දී 'ඃ' ට පූර්වයෙන් 'අ' යන්න යෙදී තිබීම අනිවාර්ය ය.
(4) විසර්ගය ව්‍යඤ්ජනයකට පසු ව පමණක් යෙදේ.
(5) අනුස්වාරය හා විසර්ගය සැම විට ම වචනයක එක සමීපයෙහි යෙදේ. (......)

1.5. එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.
(1) විදුලිය ආලෝකය, භාණ්ඩ සමීක්ෂණය, සංවාද මණ්ඩපය, සම්මන්ත්‍රණ ශාලාව
(2) අයවැය විවාදය, දේශීය ආර්ථිකය, අවුරුදු උලෙළ, වාසනා මන්දිරය
(3) ප්‍රජා අයිතිය, මූල්‍ය කළමනාකරණය, පාරිභෝගික අධිකාරිය, සංවර්ධන ඉලක්ක
(4) දුම් පරීක්ෂණය, පතාල ලෝකය, උයන් කෙළිය, පරිසර විනාශය
(5) සමාජ අසාධාරණය, මූලධර්ම වාදය, ත්‍රිපිටක අභිවන්දනය, දේශපාලන විචාරකයා (......)

[දෙවැනි පිටුව බලන්න.

1.6. තත්සම පද පමණක් යෙදී ඇති වරණය කුමක් ද?
(1) ආභරණ, දෙරණ, උපකරණ, වාරණ (2) ශාලා, ජාලා, ලූලා, මාලා
(3) නිර්ධන, නිර්ගුණ, නිර්මල, නිර්මාණ (4) සකල, සුලකළ, විකල, අකාල
(5) සුමධුර, සුධවල, සුසංවර, සුපෙම්බර (......)

1.7. තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) සසර, මිතුර, කතර, උත්තර (2) පියන, රියන, නයන, වියන
(3) පුත්, නෙත්, පත්, ගත් (4) මව, නැව, භව, පව
(5) සුදු, බුදු, මෑදු, කුදු (......)

1.8. 'යවි, කු, ප, න' යන වර්ගයන්ට අයත් අව්‍යය සමාස පද පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(1) සුසැදි, කුමන්ත්‍රණ, අනියම්, අනුමෝදනා (2) අනියම්, කුමන්ත්‍රණ, සුසැදි, අනුමෝදනා
(3) අනුමෝදනා, සුසැදි, අනියම්, කුමන්ත්‍රණ (4) සුසැදි, අනුමෝදනා, කුමන්ත්‍රණ, අනියම්
(5) අනුමෝදනා, කුමන්ත්‍රණ, සුසැදි, අනියම් (......)

1.9. කෘදන්තයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) සරන, දරණ, කරන, වරන (2) සිතු, ගෙතු, පැතු, එතු
(3) සෑරෙන, පෑරෙන, තේරෙන, වැමෑරෙන (4) බාදන, වාදන, ඡේදන, වේදන
(5) පැළිලි, බැළිලි, හැළිලි, දිළිලි (......)

1.10. පහත සඳහන් උද්ධෘතවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
(අ) "**දමාලා** යන නරක කුණු කය ..."
(ආ) "**වයව** තත් සිඳ සිඳ"
(ඉ) "එදා සහසකර පහනෙව් **කරත** හෙළි"
(ඊ) "අව්වේ තියෙන රැස්මාලා අඩු **වේවා!**"
(1) අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා, පූර්වක්‍රියා, ආශීර්වාදක්‍රියා
(2) පූර්වක්‍රියා, විධික්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා
(3) විධික්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා, පූර්වක්‍රියා
(4) පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, විධික්‍රියා, ආශීර්වාදක්‍රියා
(5) විධික්‍රියා, පූර්වක්‍රියා, අසම්භාව්‍යක්‍රියා, ආශීර්වාදක්‍රියා (......)

1.11. තද්ධිතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) දාරුමය, රජතමය, පිළිමය, වජ්‍රමය (2) අද්‍යතන, නූතන, සදාතන, මධ්‍යතන
(3) මාධුර්ය, සාමර්ථ්‍ය, ධෛර්ය, සාකල්‍ය (4) ගුණවත්, ධනවත්, බලවත්, නැණවත්
(5) මිත්තණි, දියණි, මෑණි, නැන්දණි (......)

1.12. උපසර්ගයක් **යෙදී නැති** පදයක් සහිත පද පේළිය තෝරන්න.
(1) දුෂ්කර, දුශ්ශීල, දුෂ්පෝෂණ, දුස්සාධ්‍ය (2) නිදොස්, නිවහල්, නිතරග, නිකැලැල්
(3) පබල, පමොද, පබඳ, පබොද (4) නිරවශේෂ, නිරාගමික, නිරාමිෂ, නිරපේක්ෂ
(5) සුලලිත, සුරිඳු, සුමිතුරු, සුචරිත (......)

1.13. නිපාතයක් **නොවන** පදයක් අන්තර්ගත වරණය තෝරන්න.
(1) අන්න, මෙන්න, අතන, මෙතන (2) කල්හි, සඳ, පටන්, තෙක්
(3) සඳහා, වෙනුවෙන්, පිණිස, විනිස (4) සේ, එව්, බඳු, වැනි
(5) හෙවත්, නොහොත්, වනාහි, වූකලි (......)

1.14. "මගී ජනතාවගේ **ගමනාගමන** කටයුතු **ප්‍රවර්ධනයට** නිලධාරීහු **විධිමත්** පියවර ගනිති" යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරෙන්** ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?
(1) සන්ධි, උපසර්ග හා තද්ධිත (2) උපසර්ග, සන්ධි හා තද්ධිත
(3) සන්ධි, තද්ධිත හා උපසර්ග (4) තද්ධිත, උපසර්ග හා සන්ධි
(5) උපසර්ග, තද්ධිත හා සන්ධි (......)

1.15. සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.
(1) සැරසුවා ය, මතුළා ය, වැනසුවේ ය, ඇඹරුවා ය
(2) නටද්දී, කියද්දී, මුමුණද්දී, දැමුවොත්
(3) සරසනුව, ලියනුව, පමුණුව, තබනුව
(4) තළවයි, සාදවයි, බලවයි, පාගවයි
(5) කළේ ය, බැලුවේ ය, දැම්මා ය, දුන්නේ ය (......)

[තුන්වැනි පිටුව බලන්න.

1.16. සමාසයක් **නොවන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) අහසපොළොව, ධනධාන්‍ය, වැව්මුහුද, පිඟන්කෝප්ප
(2) අනුචිත, අනාගත, අනපේක්ෂිත, අනුල්ලංඝනීය
(3) විනිසකරු, ගොපල්ලා, කම්කරු, අතවැසි
(4) දුදන, දුසිරිත්, දුබල, දුලබ
(5) ඇත්ගාල, රජඅණ, ළමාලොව, සර්පවිෂ (......)

1.17. එක ම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.
(1) පොල්ලත්ත, පත්තිරු, ගොක්කොළ, නිල්ලහස
(2) විවේකාගාරය, ජලාපවහන, රූපකාලංකාරය, ජාතිකෝත්සවය
(3) පුරඟන, නරඟන, දෙවඟන, ගවඟන
(4) නරනිඳු, බමරිඳු, කෙසරිඳු, තෙරිඳු
(5) දෑස, දෑවර, දෑළ, දෑඟිලි (......)

1.18. ව්‍යාකරණානුකූල ව **නොගැළපෙන** පදයක් ඇති වරණය කුමක් ද?
(1) පෙම්ගගුල, හදවිමන, කිතුගොස, සෝගින්න
(2) පූජෝත්සව, මහෝපාධ්‍යාය, අවස්ථෝචිත, මහෝත්තම
(3) අධිකතර, පාපතර, යෝග්‍යතර, ජ්‍යෙෂ්ඨතර
(4) නියත, කියත, විරිත, සිරිත
(5) පෑ, දෑ, නෑ, කෑ (......)

1.19. ව්‍යාකරණානුකූල ව නිවැරදි වැකිය තෝරන්න.
(1) කේයස් නොහොත් සාගර පලන්සූරිය සුදෝසුදු කාව්‍යය රචනා කළේ ය.
(2) රාජ්‍ය නායකයන් රටක ආදර්ශවත් ව හැසිරිය යුත්තාහ.
(3) විශ්වවිද්‍යාලය ශිෂ්‍යයෝ බොහෝ විට විශ්වවිද්‍යාලයේ නැත.
(4) මානව හිමිකම් සම්බන්ධ නීතීහු කලින් කල වෙනස් වෙයි.
(5) ජනාධිපතිතුමා විසින් විද්වතකු රාජ්‍ය සම්මානයෙන් පුදන ලදි. (......)

1.20. ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.
(1) දැන් ඒ ගොල්ලො සමාගමේ ලොක්කො වෙලා ද?
(2) අනුන්ට දොස් නො කියා තම රාජකාරිය ඉටු කිරීම මැනවි.
(3) දඹුල්ල පැත්තේ මං පහරන්නො කට්ටියක් ඉන්නව ලු.
(4) ඒ ළමයා උදේ හිටන් අව්වෙ වැඩ කොරන්නෙ.
(5) කිව්වත් වාලෙ උන්දැ ගෙදරට ම ඇවිල්ල නොවැ. (......)

(ලකුණු 20 යි.)

* *

[හතරවැනි පිටුව බලන්න.

● (ඊ) සහ (එ) ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සපයන්න.

(ඊ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "මම වන්නා දරුශෝකයෙන් හඬමි. තෙපි කුමක් නිසා හඬා දැ'යි"

(ii) "මොහු නුවරින් පිටත ගෙන ගොස් උක්කාරභූමියෙහි ලා පියව"

(iii) "මාගේ ස්වාමි පුත්‍රයාට පැමිණි මරණ දුක්ඛය තට ද වේව යි"

(iv) "කැනහිල් ධේනුවක් තොමෝ උතුම් වූ සිංහරාජයකු හා එක් ව කෙසේ නම් සමාගම් වේ දැ'යි"

(v) "ඒත් උඹේ පැටියන්ගෙන් බැද්ද ම සූරිකනවා"

(vi) "සතුරන් සහසක් කළ ද පරාජය - තමහට තම සිත වේ පසමිතුරා"

(vii) "ඕනෑම දෙයක් කරන්න පුළුවන්. මට උවමනා රක්ෂාවක් විතරයි."

(ලකුණු 03 × 4 = 12 යි.)

(එ) පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි වස්තු විෂයයෙහි සහ භාෂා ව්‍යවහාරයෙහි විශේෂතා කෙරෙහි අවධානය යොමු කරමින් එම නිර්මාණය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

'දුදනො'ද බිඳ
බඳ තෙද කඳ
කඳ දෙව් රද
සාමිනේ,
මගෙ කුකුළා නැසූ එකා
දදය ඔබ ගෙ පාළු යකා
තව එක බුද දිනක් තකා
ඉන්නට ඉඩ නො දී මකා,
බලා එල්ල
හෙළුව හෙල්ල
මුළු මැ බෙල්ල
මරු තැනේ,
කතර ගමට රුහුණු රටේ
හිඟා කකා, ලබන විටේ,
පයින් මැ ගොස් ඇවිදැ වටේ,
පොළොවැ උලා නළල් ඇටේ,
දිගට ඇදී
නැඟැ පැහැදී
මහ හඬ දී
"දෙවියනේ,"
රනින් කුකුළු රුවක් පුදමි
රිදියෙන් බිජු වටක් පුදමි
රන් දුනු හී දෙකක් පුදමි
රුවට රිදී රුවක් පුදමි.
"කතර ගමේ
බල මහිමේ
දුටු ද එ මේ?"
හැම තැනේ
කියමින් නම'කුරු ඔබ ගේ,
බොළඳුන් ගෙ ද කිරි තුඩ'ගේ
රඟ දෙන් නට වඩමි අගේ,
එක'තින් හිමි සඳිනි මගේ.
දුදනො'ද බිඳ
බඳ තෙද කඳ
කඳ දෙව් රද
සාමිනේ.'
'මට කළ මේ විපත අනේ
බලා-ගන්නැ දෙවියනේ.
වැජැඹෙන නා මෙ විමනේ
බලන්නැ නා සාමිනේ.'

(ලකුණු 12 යි.)

[හතරවැනි පිටුව බලන්න.

**2.** "පුද්ගල චිත්තාභ්‍යන්තරයේ පවත්නා ගූඪ ස්වරූපය විදහා දැක්වීමත් සාර්ථක අවස්ථා නිරූපණයත් සද්ධර්මරත්නාවලියේ කථාවලට නැවුම් ස්වරූපයක් එක් කරයි" නියමිත කථා වස්තු ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

**නැතහොත්**

"ස්ත්‍රී චරිත ස්වභාවයෙහි පවත්නා සංකීර්ණ ලක්ෂණ ප්‍රකට කිරීමත් ඒ සඳහා යෝග්‍ය භාෂා ව්‍යවහාරයක් උපයෝගි කොට ගැනීමත් ඇතැම් ජාතක කථාවල සාර්ථකත්වයට හේතු වී තිබේ." නියමිත කථා වස්තු ඇසුරෙන් විමසන්න. (ලකුණු 15 යි.)

**3.** "අනෘජිතිකර ආශාවන් සපුරා ගැනීමට යාම හේතුවෙන් පුද්ගලයින් පරිහානියට පත් වීම හා එබඳු සිදුවීම් පැහැදිලි කිරීම සඳහා යෝග්‍ය ධර්මෝපදේශ යොදා ගැනීම සද්ධර්මාලංකාරයේ කැපී පෙනෙන ලක්ෂණ වේ." නියමිත කථා ආශ්‍රයෙන් පිරික්සන්න.

**නැතහොත්**

"ළමයින්ගේ චිත්ත ස්වභාවය නිරූපණය කරන ආකාරයත් යහපත් සමාජාශ්‍රය හේතුවෙන් ඔවුන් තම ජීවිත සාර්ථක කර ගන්නා ආකාරයත් පූජාවලියෙහි ඇතැම් කථා මගින් ප්‍රකට කෙරේ." නියමිත කථා ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

**4.** (අ) විවිධාංගවලින් පෝෂිත පද්‍ය සාහිත්‍යයක් කෝට්ටේ අවධියෙහි දක්නට ලැබේ. එබඳු විවිධාංග **තුනක් වත්** ඇසුරෙන් මේ මතය විමර්ශනය කරන්න. (ලකුණු 07 යි.)

(ආ) "අවස්ථානුකූල ව විවිධ වර්ණනා යොදා ගැනීමත් ඒවා ශබ්දාර්ථ රසයෙන් විචිත්‍රවත් කිරීමත් හේතු කොට ගෙන ගුත්තිල කාව්‍යය පාඨකයාගේ සිත් ගනී." විමර්ශනය කරන්න. (ලකුණු 08 යි.)

**5.** බැද්දේගම නවකතාවේ කේන්ද්‍රීය චරිතය වන සිලිඳු, වනසතුන් හා තම දියණියන් දෙදෙනා සමගත් ගම්වැසියන් සමගත් පැවැත්වූ සබඳතාවල ස්වභාවය නිදසුන් ආශ්‍රයෙන් වෙන වෙන ම පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

**6.** "කෙටිකතා මාධ්‍යයෙහි සියුම් හා කලාත්මක ලක්ෂණ පිළිබඳ මනා පරිචයත් සමකාලීන ලාංකේය සමාජයෙහි යථා ස්වභාවය ගැඹුරින් ප්‍රතිනිර්මාණයත් නූතන කෙටිකතා රචකයන්ගේ නිර්මාණවල කැපී පෙනෙන ලක්ෂණයකි." නියමිත කතා **තුනක් වත්** ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි.)

**7.** උපයුක්ත භාෂාව හා වස්තුවිෂය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් කොළඹ කවියේ ප්‍රථම තරංගයට/අවධියට අයත් කවීන් විසින් රචිත ළමා කාව්‍ය නිර්මාණවල දිස් වන විශේෂතා පැහැදිලි කරන්න. (ලකුණු 15 යි.)

**8.** "නාට්‍යෝචිත අවස්ථා මතු කිරීමත් එමගින් සංකීර්ණ මානව චිත්තාවේග නිරූපණය කිරීමත් හේතු කොට ගෙන 'පෙමතො ජායතී සොකො' නාට්‍යය සහෘදයාගේ සිත් දිනා ගනී." විමර්ශනය කරන්න. (ලකුණු 15 යි.)

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

සිංහල II
சிங்களம் II
Sinhala II

71 S II

## II කොටස

- මෙම කොටසින් **2, 3** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

**2.** (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලෝකයේ බොහෝ රටවල් මෙන් ම ශ්‍රී ලංකාව ද වැඩිහිටි ජනගහන ප්‍රතිශතය ඉහළ යාමේ සමාජ අර්බුදයට මුහුණ දෙමින් සිටී. මෙම වැඩිහිටියන්ට රැකවරණය සැලසීම සම්බන්ධයෙන් වර්තමානයේ ප්‍රබල සමාජ මතයක් ගොඩනැගෙමින් පවතී. බටහිර රටවලටත් ඇතැම් පෙරදිග රටවලටත් වඩා ශ්‍රී ලාංකේය පවුල හා ප්‍රජාව තුළ වැඩිහිටියන් රැකබලා ගැනීමට අදාළ ව ක්‍රියාත්මක වූ ප්‍රජාපාදක ආරක්ෂිත ජාලයක් පැවති බව සාම්ප්‍රදායික සමාජ රටාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. වර්තමානයේ පවා බොහෝ වැඩිහිටියන් තම දරුමුණුබුරන් හෝ ඥාතීන් සමග ජීවත් වීමට වැඩි කැමැත්තක් දක්වන බව සමාජ පර්යේෂකයෝ පවසති. සාඵල්‍යතාව අඩුවීම නිසා දරුවන්ගේ ප්‍රමාණය පහළ යාම, දේශීය හා විදේශීය සංක්‍රමණ, නාගරීකරණය හා කාන්තාවන් රැකියාවල නිරත වීම ආදි සාධකවල සෘජු බලපෑම නිසා පවුල කේන්ද්‍රීය ව ක්‍රියාත්මක වූ වැඩිහිටියන් රැකබලා ගැනීමේ ක්‍රියාවලිය වර්තමානයේ අභියෝගයකට ලක් වෙමින් පවතී. බොහෝ පර්යේෂකයන් පෙන්වා දෙන පරිදි ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි සිදුවන ප්‍රජාවිද්‍යාත්මක හා සමාජ, ආර්ථික වෙනස්කම් හේතුවෙන් හටගැනෙන පවුල් විසංවිධානය නිසා වියපත් වූවන්ගේ රැකවරණය සඳහා පවුල තුළ සක්‍රිය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වීමට බාධා මතු වේ. දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා තදනුබද්ධ ධනාත්මක ලක්ෂණ, යටිතල පහසුකම් හා අවශේෂ සේවාවන් ප්‍රවර්ධනය කිරීමටත් කළමනාකරණ ක්‍රියාවලිය වඩාත් විධිමත් කිරීමටත් කාර්ය මණ්ඩලයට නිසි පුහුණුවක් ලබා දීමටත් අවශ්‍ය කටයුතු සම්පාදනය වුවහොත් මෙරට සංස්කෘතියට හා සමාජ ව්‍යූහයට ගැළපෙන ආකෘතියක් ගොඩනගා ගැනීමට හැකියාවක් ලැබෙනු ඇත. වියපත් වූවන් හැකිතාක් දුරට රටේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේ කොටස්කරුවන් බවට පත් කර ගැනීමට ප්‍රතිපත්ති සැකසීම ඔවුන්ගේ කායික හා මානසික සෞඛ්‍යය යහපත් වීමටත් රටේ සංවර්ධන ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් වීමටත් බලපානු ඇත.

(i) සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සමාජයේ වැඩිහිටියන් රැකබලා ගැනීම උදෙසා ක්‍රියාත්මක වූ වැඩපිළිවෙළ ලේඛකයා හඳුන්වන්නේ කවර නමකින් ද?

(ii) වැඩිහිටියන් රැකබලා ගැනීම සඳහා අතීතයේ පැවති ක්‍රියාවලිය වර්තමානයේ අභියෝගයකට ලක් ව ඇත්තේ කවර කරුණු හේතුවෙන් ද?

(iii) වියපත් වූවන්ගේ කායික හා මානසික සෞඛ්‍යය යහපත් කිරීම උදෙසා ලේඛකයා යෝජනා කරන්නේ කුමක් ද?

(iv) මෙම පාඨයෙහි සඳහන් වන ආකාරයට මෙරට සංස්කෘතියට හා සමාජ ව්‍යූහයට ගැළපෙන ආකෘතියක් ගොඩනගා ගැනීමට සම්පාදනය විය යුතු අවශ්‍යතා මොනවා ද?

(v) වියපත් වූවන්ගේ රැකවරණය සඳහා පවුල තුළ සක්‍රිය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වීමට බාධාව වශයෙන් සමාජ පර්යේෂකයන් දක්වන්නේ කුමක් ද?

(vi) මෙහි දැක්වෙන පරිදි ලෝකයේ බොහෝ රටවල් හා ශ්‍රී ලංකාව මුහුණ පාන්නේ කෙබඳු සමාජ අර්බුදයකට ද?

(ලකුණු 12 යි.)

[පස්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යාව **තුනෙන් එකක් පමණ වන සේ** සාරාංශ කොට ලියා, සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සහභාගිත්ව සංවර්ධනය බිහිවන්නේ දුප්පත් ජනතාවගේ ස්වශක්තිය, සහභාගිත්වය එක්වී බිහි වන නිර්මාණනීය නව උත්පාදන ශක්තිය තුළිනි. එහෙයින් ම මෙම සහභාගිත්ව සංවර්ධන ක්‍රියාවලිය අතිශයින් ම ගැඹුරු වනු පෙනේ. එමෙන් ම අර්ථවත් වනු දිසේ. අනෙක් අතට ජනතා පදනමක් ද එහිලා පැනේ. එමතු ද නොව පවත්නා සාම්ප්‍රදායික සංවර්ධනය වෙනුවට බිහිවන විකල්ප සංවර්ධන ක්‍රියාවලියක් ද වනු ඇත. සහභාගිත්ව සංවර්ධනය බාහිර මූල්‍යාධාර, මහජන ප්‍රයෝජනයට අදාළ විවිධ සහනාධාර හෝ වෙනත් ද්‍රව්‍යමය ආධාර ආදිය අපේක්ෂාවෙන් ආරම්භ කරනු ලබන සංවර්ධන ක්‍රියාදාමයක් නම් නො වේ. සාම්ප්‍රදායික සංවර්ධනයේ දී දිළිඳු ජනතාවගේ නිර්මාණ ශක්තිය මතු වීමට පෙරාතුව ම බාහිර ආධාර ඉස්මතු වෙයි. ඒ සමග ම නැගී එන අංකුර නවෝත්පාදන දහරා වියැකී යයි. නමුත් සහභාගිත්ව සංවර්ධනයේ දී බාහිර ආධාරයන් මත නොව ජනතාවගේ ස්වශක්තිය හා සහභාගිත්වය එක්වීමෙන් බිහිවන නිර්මාණ ශක්තිය සංවර්ධනයේ ඒකායන බලවේගය බවට පත් වෙයි. බාහිර ආධාර සහ සහනාධාර මත පදනම් වූ වැඩසටහන් එම ආධාර ලැබීම් නැවැතීමත් සමග ම ඇණ හිටී. නැතහොත් අතුරුදහන් වනු ඇත. නමුත් සහභාගිත්ව සංවර්ධනයේ දී එසේ නොවන්නේ ජනතාවගේ නිර්මාණාත්මක නවෝත්පාදන ශක්තිය ඒ වන විට වර්ධනය වී සියත් බව තුළ සහභාගිත්වයේ ම රැඳෙන බැවිනි.

(ලකුණු 13 යි.)

3. දී ඇති මාතෘකාවලින් **එකකට** අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) දේශපාලන අරගල, මැතිවරණ සහ ශ්‍රී ලංකාවේ අනාගත අභියෝග
(ii) ගෝලීය ත්‍රස්තවාදය මැඩපැවැත්වීමට ලෝක බලවතුන් මැදිහත් වීමේ අවශ්‍යතාව
(iii) භාෂාව, සාහිත්‍යය මෙන් ම ඉතිහාසය ද හැදෑරීමට පාසල් ශිෂ්‍යයන් යොමු කරවීමේ කාලෝචිත බව
(iv) ජයග්‍රහණය ම නො ව කායික - මානසික සෞඛ්‍ය වර්ධනය ද ක්‍රීඩාවේ පරමාර්ථවලින් එකකි.
(v) මෙරට පාසල් ශිෂ්‍යයන්ගේ නව නිපැයුම් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට යොදා ගැනීමේ යෝග්‍යතාව

(ලකුණු 25 යි.)

4. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) මේ කර්මාන්ත ශාලාවෙහි ඉතා දක්ෂ සේවකයන් ඇත.
(ii) අනාථ නිවාස පාලිකාව ඔහු දරුවෙක් මෙන් ඇති දැඩි කළා ය.
(iii) අපි වෙනුවෙන් වැඩ කිරීම සඳහා අපි ම පෙළ ගැසෙමු.
(iv) 'වීරාභිවන්දන' උලෙළේ දී ඇමතිතුමා විසින් ජාතික වීරයෝ ඇගයෙති.
(v) තනතුරු ලෝභයෙන් කටයුතු කරන්නෝ ආත්මාර්ථකාමීන් වෙති.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න.

(i) ජනාධිපති විදේශ නියෝජිතවරියක පිළිගත්තේ ය.
(ii) සමාජ සේවකයෙක් දුප්පත් ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට පොත්-පත් බෙදා දෙයි.
(iii) ඔවුහු අධිකරණ නීති-රීතීන් උල්ලංඝනය කරති.
(iv) කවුරු මේ විශාල වෘක්ෂයන් කපා බිම හෙළත් ද?
(v) කුමරතුඟු මුනිදස්හු 'ව්‍යාකරණ විවරණය' ලියූහ.

(ඉ) නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) (කෘමීන්/කෘමීහු) කුඹුර විනාශ කරති'යි (ගොවියෙක්/ගොවියකු) දුකින් පසු වෙයි.
(ii) (නිළියක්/නිළියක) වේදිකාවේ නටනවා (ප්‍රේක්ෂකයෝ/ප්‍රේක්ෂකයන්) බලා සිටිති.
(iii) ලංකාවේ රාජ්‍ය නායකයා (හෙවත්/නොහොත්) ජනාධිපතිතුමා ඒ සමුළුවට සහභාගි (වූයේ ය/වූහ).
(iv) (නිවේදකයකු/නිවේදකයෙක්) විසින් ආරාධිත (අමුත්තන්/අමුත්තෝ) පිළිගන්නා ලදහ.
(v) (මැරයන්/මැරයෝ) සාමාන්‍ය ජනතාව බිය ගන්වද්දී වගකිව (යුත්තෝ/යුත්තන්) නිහඬ ව සිටිති.

(ලකුණු 05 × 3 =15 යි.)

[හයවැනි පිටුව බලන්න.

**5.** පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

(i) **සඳහිරු** පවත්නා **තුරු** මේ වටිනා වස්තුහු අන්සතු නො **වෙත්වා**! (**සඳහිරු** - සමාස, **තුරු** - නිපාත, **වෙත්වා** - ක්‍රියා)

(ii) **පුරාංගනාවෝ** නුවනත මෙන් ම **වරලස** ද **සුවඳ** ජලයෙන් සේදූහ. (**පුරාංගනා** - සන්ධි, **වරලස** - තද්ධිත, **සුවඳ** - උපසර්ග)

(iii) ජාතික ගීය **ගයද්දී** සියල්ලෝ **ම** **අසුන්වලින්** නැඟී සිටියහ. (**ගයද්දී**-ක්‍රියා, **ම** - නිපාත, **අසුන්වලින්** - විභක්ති)

(iv) **පෙම්වතා** තම ප්‍රියාවගේ **දැත** තරයේ ගෙන සවනතට ආදර ගීයක් **මුමුණමින්** ප්‍රීති වූයේ ය. (**පෙම්වතා** - තද්ධිත, **දැත** - සන්ධි, **මුමුණමින්** - ක්‍රියා)

(v) **සුළඟින්** **සෙලවුණු** තුරුපත් පෙළ සෙමින් එළිමහන් **රංගභූමියෙහි** පතිත විය. (**සුළඟින්** - විභක්ති, **සෙලවුණු**- කෘදන්ත, **රංගභූමියෙහි** - විභක්ති)

(ලකුණු 03 × 5 =15 යි.)

**6.** (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය පහත වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) මෙවර රාජ්‍ය සාහිත්‍ය ...................... උත්කර්ෂවත් අයුරින් පැවැත්වීමට විධිවිධාන යොදා ඇත.

(ii) වසන්ත කාලයෙහි ඇසෙන කෝකිල ...................... සැමගේ කන් පිනවයි.

(iii) ගල්ලෙන්වල ඇති ...................... බිතුසිතුවම් සංරක්ෂණය කළ යුතු ය.

(iv) අපේ ගමෙහි සාම්ප්‍රදායික ජන ක්‍රීඩාවන්ගෙන් යුතු අලුත් අවුරුදු ...................... පැවැත්විණි.

(v) මනාල යුවළ පෝරුවට නඟින විට බාලිකාවෝ ජය මඟුල් ...................... ගැයූහ.

(vi) සමහර ...................... ගෘහනිර්මාණ ශිල්පීය ලක්ෂණ වර්තමානයේ ද ඇගයීමට ලක් වේ.

(පුරාණ, උලෙළ, ගීත, උත්සවය, පැරණි, ගී) (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

(i) හත් + අඩිය

(ii) දෙ + අඟුල්

(iii) කථා + උපකථන

(iv) ශාලා + අධිපති

(v) පස් + සාළිස්

(vi) පුන + උත්ථාපන

(ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඉ) **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) ගවේෂකයා **රටින් රටට** යමින් තොරතුරු එක් රැස් කළේ ය.

(ii) **සිංහලයනි**, නැඟිටිවු. **බුද්ධගයාව** බේරා ගනිවු!

(iii) **තම** භාණ්ඩාගාරය තර කිරීම **ධනවතාගේ** ඒකායන පරමාර්ථය විය. (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

(i) මහත්මයාණනි මහත්මියනි, පෙව 9.00ට රැස්වීම ඇරඹෙන බව දැනුම් දෙමි.

(ii) 'අනේ මගේ පුත්‍රයා කොහි ද' යනුවෙන් ඈ විලාප නැඟුවා ය.

(iii) ඉඳ ඉඳ එක වෙහෙර
විඳ විඳ දහම් මනහර
සිඳ බිඳ දුක් සසර
අහෝ දෙව්දත් නුදුටි මොක්පුර
යන කවිය ඔහු සිහින් ස්වරයෙන් මිමිණුවේ ය. (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "මම මගේ කාර්යය නීත්‍යානුකූල ව ඉටු කරමි"යි ලේකම් නිවේදනය කළේ ය.

(ii) ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට "නුඹ නුඹගේ වගකීම ඉටු කරනු"යි විනිශ්චයකාරයා අණ කළේ ය.

(iii) "අපි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අද පටන් බලාත්මක කරනවා"යි මන්ත්‍රීවරු එක හඬින් කියා සිටියහ.

(ලකුණු 01 × 3 = 03 යි.)

[හත්වැනි පිටුව බලන්න.

+94 71 800 8533 / +94 77 088 2228 WWW.PADANAMAPUBLICATION.LK

**7.** පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**කාශ්‍යපයෝ** සූර්යයා **අස්තංගත** වන සන්ධ්‍යා යාමයේ සීගිරි පර්වතයේ අවරදිග පාර්ශ්වයෙහි ගල්තලාවක් මත අසුන් ගෙන සිටියහ. තම සහෝදරයා ජම්බු ද්වීපයෙන් මහා සේනාවක් ගෙන තමාට හිමි රාජ්‍යත්වය ලබා ගැනීම පිණිස මේ භූමිය **ආක්‍රමණය** කිරීමට පැමිණෙමින් සිටින බව චරපුරුෂයන් ඔහුට දැනුම් දී තිබිණ. සැබවින් ම මේ ස්වභාවාලංකාරයෙන් රමණීය පර්වත බලකොටුව යුද්ධමය වශයෙන් වැදගත් යැයි ඔහු කිසි විටෙක නො සිතුවේ ය. මෙය සතර අතින් වට කළොත් සියලු සැපයුම් මාර්ග අවහිර වනු ඇත. එවිට සුරතින් කඩුව ගෙන ගෙල සිඳ ගැනීම හැර වෙනත් විකල්පයක් නොමැත. තම ජීවිතය විනාශ වූයේ නමුදු මේ **ආහ්ලාදජනක** රම්‍ය කලා නිකේතනය, **මනෝරසද්ජනීය** වූ සිත්තම් පෙළ වැනසෙනු දැකීමට ඔහු ඉඩ නො දෙන්නේ ම ය. එසේ ම තම අන්තඃපුරයේ සිටින **සුරවමියන්** බඳු **පුරවමියන්** මිය යනු දැකීම ද කෙසේ වත් ඉවසිය නො හැකි ය. එබැවින් කාශ්‍යප පර්වතයෙන් බැස යුද පෙරමුණ වෙත ගමන් කරනුයේ අතරමඟ දී සිය දිවි හානි කර ගත්තේ ය.

(i) ඡේදයේ **තද කළු** අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළට සකස් කර ලියන්න.

(ii) සීගිරි, සිතුවේ ය, දැකීම යන වචනවල යෙදී ඇති පිළි වෙන වෙන ම ලියන්න.

(iii) ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

1. රකාරාංශයක් හා මූර්ධජ අක්ෂරයක් සහිත වචනයක්
2. නාසික්‍යාක්ෂර තුනක් අන්තර්ගත වචනයක්
3. ඝෝෂ තාලුජ ව්‍යඤ්ජනාක්ෂරයක් හා යංශය සහිත වචනයක්

(iv) පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විධිය දක්වන්න.
ස්වභාවාලංකාර, සුරතින්, සිත්තම්

(v) පහත දැක්වෙන ක්‍රියා වර්ගවලට උදාහරණ වචනය බැගින් ඡේදයෙන් උපුටා දක්වන්න.
මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා (අතීත බහු වචනයක්), අසම්භාව්‍යක්‍රියා

(ලකුණු 03 × 5 =15 යි.)

**8.** පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) පූර්වස්වර ලෝප සන්ධිය
(ii) පූර්වක්‍රියා
(iii) විශේෂණ සමාසය
(iv) අනම්‍යකරණය
(v) කණ්ඨ්‍යජ අක්ෂර

(ලකුණු 05 × 3 =15 යි.)

* * *

## II කොටස

- මෙම කොටසින් 2, 3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

2. (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලෝකයේ බොහෝ රටවල් මෙන් ම ශ්‍රී ලංකාව ද වැඩිහිටි ජනගහන ප්‍රතිශතය ඉහළ යාමේ සමාජ අර්බුදයට මුහුණ දෙමින් සිටී. මෙම වැඩිහිටියන්ට රැකවරණය සැලසීම සම්බන්ධයෙන් වර්තමානයේ ප්‍රබල සමාජ මතයක් ගොඩනැගෙමින් පවතී. බටහිර රටවලටත් ඇතැම් පෙරදිග රටවලටත් වඩා ශ්‍රී ලාංකේය පවුල හා ප්‍රජාව තුළ වැඩිහිටියන් රැකබලා ගැනීමට අදාළ ව ක්‍රියාත්මක වූ ප්‍රජාපාදක ආරක්ෂිත ජාලයක් පැවති බව සාම්ප්‍රදායික සමාජ රටාව පිළිබඳ අධ්‍යයනය කිරීමේ දී පැහැදිලි වේ. වර්තමානයේ පවා බොහෝ වැඩිහිටියන් තම දරුමුණුබුරන් හෝ ඥාතීන් සමග ජීවත් වීමට වැඩි කැමැත්තක් දක්වන බව සමාජ පර්යේෂකයෝ පවසති. සාඵල්‍යතාව අඩුවීම නිසා දරුවන්ගේ ප්‍රමාණය පහළ යාම, දේශීය හා විදේශීය සංක්‍රමණ, නාගරීකරණය හා කාන්තාවන් රැකියාවල නිරත වීම ආදි සාධකවල සෘජු බලපෑම නිසා පවුල කේන්ද්‍රීය ව ක්‍රියාත්මක වූ වැඩිහිටියන් රැකබලා ගැනීමේ ක්‍රියාවලිය වර්තමානයේ අභියෝගයකට ලක් වෙමින් පවතී. බොහෝ පර්යේෂකයන් පෙන්වා දෙන පරිදි ශ්‍රී ලාංකේය ජන සමාජයෙහි සිදුවන ප්‍රජාවිද්‍යාත්මක හා සමාජ, ආර්ථික වෙනස්කම් හේතුවෙන් හටගැනෙන පවුල් විසංවිධානය නිසා වියපත් වූවන්ගේ රැකවරණය සඳහා පවුල තුළ සක්‍රිය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වීමට බාධා මතු වේ. දිවා සුරැකුම් මධ්‍යස්ථාන හා තදනුබද්ධ ධනාත්මක ලක්ෂණ, යටිතල පහසුකම් හා අවශේෂ සේවාවන් ප්‍රවර්ධනය කිරීමටත් කළමනාකරණ ක්‍රියාවලිය වඩාත් විධිමත් කිරීමටත් කාර්ය මණ්ඩලයට නිසි පුහුණුවක් ලබා දීමටත් අවශ්‍ය කටයුතු සම්පාදනය වුවහොත් මෙරට සංස්කෘතියට හා සමාජ ව්‍යූහයට ගැළපෙන ආකෘතියක් ගොඩනගා ගැනීමට හැකියාවක් ලැබෙනු ඇත. වියපත් වූවන් හැකිතාක් දුරට රටේ සමස්ත සංවර්ධන ක්‍රියාවලියේ කොටස්කරුවන් බවට පත් කර ගැනීමට ප්‍රතිපත්ති සැකසීම ඔවුන්ගේ කායික හා මානසික සෞඛ්‍යය යහපත් වීමටත් රටේ සංවර්ධන ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් වීමටත් බලපානු ඇත.

(i) සාම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සමාජයේ වැඩිහිටියන් රැකබලා ගැනීම උදෙසා ක්‍රියාත්මක වූ වැඩපිළිවෙළ ලේඛකයා හඳුන්වන්නේ කවර නමකින් ද?

(ii) වැඩිහිටියන් රැකබලා ගැනීම සඳහා අතීතයේ පැවති ක්‍රියාවලිය වර්තමානයේ අභියෝගයකට ලක් ව ඇත්තේ කවර කරුණු හේතුවෙන් ද?

(iii) වියපත් වූවන්ගේ කායික හා මානසික සෞඛ්‍යය යහපත් කිරීම උදෙසා ලේඛකයා යෝජනා කරන්නේ කුමක් ද?

(iv) මෙම පාඨයෙහි සඳහන් වන ආකාරයට මෙරට සංස්කෘතියට හා සමාජ ව්‍යූහයට ගැළපෙන ආකෘතියක් ගොඩනගා ගැනීමට සම්පාදනය විය යුතු අවශ්‍යතා මොනවා ද?

(v) වියපත් වූවන්ගේ රැකවරණය සඳහා පවුල තුළ සක්‍රිය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වීමට බාධාව වශයෙන් සමාජ පර්යේෂකයන් දක්වන්නේ කුමක් ද?

(vi) මෙහි දැක්වෙන පරිදි ලෝකයේ බොහෝ රටවල් හා ශ්‍රී ලංකාව මුහුණ පාන්නේ කෙබඳු සමාජ අර්බුදයකට ද?

(ලකුණු 12 යි.)

(අ) සඳහා පිළිතුරු

i. ප්‍රජාපාදක ආරක්ෂිත ජාලය යන නාමයෙන්

ii. 1. සාඵල්‍යතාව අඩු වීම නිසා දරුවන්ගේ ප්‍රමාණය පහළ යාම

2. දේශීය හා විදේශීය සංක්‍රමණ

3. නාගරීකරණය

4. කාන්තාවන් රැකියාවල නිරත වීම

**(සම්පූර්ණ පිළිතුරට ලකුණු 02කි. කොටස් 02ක් හෝ 03ක් හෝ ඇත්නම් ලකුණු 01කි.**

**එක් කොටසක් පමණක් ඇත්නම් ලකුණු හිමි නො වේ.)**

- විවිධ ආධාර මත යැපෙන වැඩසටහන්, ඒවා නොලැබීමෙන් නැවතුණත් සහභාගිත්ව සංවර්ධනයේ දී එසේ නො වන්නේ ජනතාවගේ නවෝත්පාදන ශක්තිය වර්ධනය වී සියත් බව තුළ රැඳෙන බැවින් වීම

**ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාංශය එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු අතර ඡේදවලට බෙදා ඇත්නම් සමස්තයෙන් ලකුණු 02ක් අඩු වේ. වචන සංඛ්‍යාව 50 - 60 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි හෝ වේ නම් ලකුණු 03ක් අඩු වේ.**

| | | |
|---|---|---|
| සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට | - | ලකුණු 02 යි. |
| අක්ෂර වින්‍යාසයට | - | ලකුණු 03 යි. |
| අන්තර්ගතයට | - | ලකුණු 08 යි. |

**3.** දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන **300 - 350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) දේශපාලන අරගල, මැතිවරණ සහ ශ්‍රී ලංකාවේ අනාගත අභියෝග

(ii) ගෝලීය ත්‍රස්තවාදය මැඩපැවැත්වීමට ලෝක බලවතුන් මැදිහත් වීමේ අවශ්‍යතාව

(iii) භාෂාව, සාහිත්‍යය මෙන් ම ඉතිහාසය ද හැදෑරීමට පාසල් ශිෂ්‍යයන් යොමු කරවීමේ කාලෝචිත බව

(iv) ජයග්‍රහණය ම නො ව කායික - මානසික සෞඛ්‍ය වර්ධනය ද ක්‍රීඩාවේ පරමාර්ථවලින් එකකි.

(v) මෙරට පාසල් ශිෂ්‍යයන්ගේ නව නිපැයුම් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට යොදා ගැනීමේ යෝග්‍යතාව

(ලකුණු 25 යි.)

**වචන සංඛ්‍යාව 300 - 350 අතර වේ නම් ඉහළ ලකුණු ප්‍රදානය කළ හැකි ය. වචන 400ට වැඩි වේ නම් හෝ 250ට අඩු වේ නම් හෝ ලකුණු 03ක් අඩු කළ යුතු වේ.**

වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

i. රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය
ii. එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
iii. කරුණුවල පැහැදිලි බව
iv. නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම
v. ව්‍යාකරණ දෝෂ රහිත වීම
vi. භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම
vii. සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම
viii. කියවිය හැකි සේ අත්අකුරු පැහැදිලි වීම

- විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.)

5. පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරෙන්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

(i) **සඳහිරු** පවත්නා **තුරු** මේ වටිනා වස්තුහු අත්සතු නො **වෙත්වා**! (**සඳහිරු** - සමාස, **තුරු** - නිපාත, **වෙත්වා** - ක්‍රියා)

(ii) **පුරාංගනාවෝ** නුවනත මෙන් ම **වරලස** ද **සුවඳ** ජලයෙන් සෝදති. (**පුරාංගනා** - සන්ධි, **වරලස** - තද්ධිත, **සුවඳ** - උපසර්ග)

(iii) ජාතික ගීය **ගයද්දී** සියල්ලෝ **ම අසුන්වලින්** නැගී සිටියහ. (**ගයද්දී**-ක්‍රියා, **ම** - නිපාත, **අසුන්වලින්** - විභක්ති)

(iv) **පෙම්වතා** තම ප්‍රියාවගේ **දෑත** තරයේ ගෙන සවනතට ආදර ගීයක් **මුමුණමින්** ප්‍රීති වූයේ ය. (**පෙම්වතා** - තද්ධිත, **දෑත** - සන්ධි, **මුමුණමින්** - ක්‍රියා)

(v) **සුළඟින් සෙලවුණු** තුරුපත් පෙළ සෙමින් එළිමහන් **රංගභූමියෙහි** පතිත විය. (**සුළඟින්** - විභක්ති, **සෙලවුණු**- කෘදන්ත, **රංගභූමියෙහි** - විභක්ති)

(ලකුණු 03 × 5 =15 යි.)

| වචනය | ව්‍යාකරණ අංගය | අනු අංගය |
|---|---|---|
| i සඳහිරු | සමාස | ද අරුත් සමස් / ද කාරාර්ථ / ද්වන්ද / චාර්ථ සමාසය |
| තුරු | නිපාත | සීමා අර්ථය |
| වෙත්වා | ක්‍රියා | ආසි කිරිය / ආශිර්වාද / ප්‍රාර්ථනා ක්‍රියා |
| ii පුරාංගනාවෝ | සන්ධි | සමාන ස්වර දීර්ඝ / සවර්ණ ස්වර දීර්ඝ / ස්වර දීර්ඝ |
| වරලස | තද්ධිත | ස්වාර්ථය / එය ම යන අර්ථය |
| සුවඳ | උපසර්ග | වඩා යන අර්ථය / අධික යන අර්ථය / අර්ථෝද්දීපනය කිරීම් අර්ථය / භූෂණාර්ථය |
| iii ගයද්දී | ක්‍රියා | අසම්භාව්‍ය ක්‍රියා / අසබඟව් කිරිය /කාලාර්ථ අසම්භාව්‍ය ක්‍රියාව / කල් අරුත් අසබඟව් කිරිය |
| ම | නිපාත | අවධාරණ අර්ථය |
| අසුන්වලින් | විභක්ති | අවධි විභක්තිය / අවදි විබත් / පඤ්චමී විභක්තිය |
| iv පෙම්වතා | තද්ධිත | අස්ත්‍යර්ථය / ඇත යන අර්ථය |
| දෑත | සන්ධි | ස්වරාදේශ සන්ධි / සරදෙස් සඳ |
| මුමුණමින් | ක්‍රියා | මිශ්‍ර ක්‍රියා / මුසු කිරිය |
| v සුළඟින් | විභක්ති | කරණ විභක්තිය / කරණ විබත් |
| සෙලවුණු | කෘදන්ත | අතීත කෘදන්ත /කර්මකාරක අතීත කෘදන්ත |
| රංගභූමියෙහි | විභක්ති | අදර විබත් / ආධාර විභක්තිය / සප්තමී විභක්තිය |

(ලකුණු (01 x 3) x 5 = 15 යි.)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

(i) මහත්මයාණනි මහත්මියනි, පෙව 9.00ට රැස්වීම ඇරඹෙන බව දැනුම් දෙමි.

(ii) 'අනේ මගේ පුත්‍රයා කොහි ද' යනුවෙන් ඈ විලාප නැගුවා ය.

(iii) ඉඳ ඉඳ එක වෙහෙර
විඳ විඳ දහම් මනහර
සිඳ බිඳ දුක් සසර
අහෝ දෙව්දත් නුදුටි මොක්පුර
යන කවිය ඔහු සිහින් ස්වරයෙන් මිමිණුවේ ය. (ලකුණු $\frac{1}{2} \times 6 = 03$ යි.)

i. මහත්මයාණනි/ මහත්මියනි, පෙ.ව. 9.00ට රැස්වීම ඇරඹෙන බව දැනුම් දෙමි.

ii. 'අනේ! මගේ පුත්‍රයා කොහි ද?' යනුවෙන් ඈ විලාප නැගුවා ය.

iii. "ඉඳ ඉඳ එක වෙහෙර
විඳ විඳ දහම් මනහර
සිඳ බිඳ දුක් සසර
අහෝ! දෙව්දත් නුදුටි මොක්පුර"
යන කවිය ඔහු සිහින් ස්වරයෙන් මිමිණුවේ ය.

(ලකුණු ½ x 6 = 03 යි.)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) "මම මගේ කාර්යය නීත්‍යනුකූල ව ඉටු කරමි"යි ලේකම් නිවේදනය කළේ ය.

(ii) ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට "නුඹ නුඹගේ වගකීම ඉටු කරනු"යි විනිශ්චයකාරයා අණ කළේ ය.

(iii) "අපි ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අද පටන් බලාත්මක කරනවා"යි මන්ත්‍රීවරු එක හඬින් කියා සිටියහ. (ලකුණු $01 \times 3 = 03$ යි.)

i. තමා තමාගේ කාර්යය නීත්‍යනුකූල ව ඉටු කරන බව / වග ලේකම් නිවේදනය කළේ ය.

ii. ජාතික ආරක්ෂාව තහවුරු කිරීමට ඔහු ඔහුගේ /ඇය ඇයගේ වගකීම ඉටු කරන ලෙස / මෙන් විනිශ්චයකාරයා අණ කළේ ය.

iii. තමන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත එදින / එම දින පටන් බලාත්මක කරන බව / වග මන්ත්‍රීවරු එක හඬින් කියා සිටියහ.

(ලකුණු 01 x 3 = 03 යි.)

8. පහත සඳහන් මාතෘකාවලින් **තුනක්** තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) පූර්වස්වර ලෝප සන්ධිය
(ii) පූර්වක්‍රියා
(iii) විශේෂණ සමාසය
(iv) අනම්‍යකරණය
(v) කණ්ඨජ අක්ෂර

(ලකුණු 05 × 3 =15 යි.)

**(මෙහි හැඳින්වීමට ලකුණු 02 යි. උදාහරණවලට ලකුණු 03 යි.)**

(i) පූර්වසවර ලෝප සන්ධිය

පූර්වස්වරය ලොප් කොට, පරස්වරය පූර්ව පදයේ අග ඇති ව්‍යඤ්ජනය හා ගැළපීමෙන් සකසා ගන්නා සන්ධිය පූර්වස්වර ලෝප සන්ධිය නම් වේ.

උදා: දින + ඉසුරු = දිනිසුරු
යන + එන = යනෙන
දිගු + ආ = දිගා (දීර්ඝායුෂ)
සුර + ඉඳු = සුරිඳු
ධන + ඇති = ධනැති ආදි උදාහරණ

(ii) පූර්ව ක්‍රියා

කර්තෘගේ අවසාන ක්‍රියාවට පෙර එම කර්තෘ විසින් කරනු ලැබූ සියලු ක්‍රියා පූර්ව ක්‍රියා වශයෙන් හඳුන්වයි.

උදා: පැමිණ, නරඹා, බලා, හඬා, ගයා, නටා, ලියා, කියා, නැමැඳ, පැමිණ, විකොට, බී, බීලා, කාලා

- අම්මා මල් කඩා බුදුන් වැන්දා ය.
- මම ලිපියක් ලියා එය කියවීමි.
- නංගී ගී ගයා නැටුමක් ඉදිරිපත් කළා ය.

iii. විශේෂණ සමාසය

තුල්‍යාධිකරණ විශේෂණයක්, විශේෂ්‍යය සමඟ ගැළපී සිදුවන සමාසය විශේෂණ සමාසය නම් වෙයි.

පූර්ව පදයෙහි හා පර පදයෙහි ලක්ෂණ අනුව විශේෂණ සමාසය පස් වැදෑරුම් ය.

1. විශේෂණ පූර්ව පද සමාසය - නිල්අහස, සුදුගොනා, සිසිල්පැන්
2. විශේෂණ උත්තර/අපර පද සමාසය - සේනකපඬි, රහල්කුමරු, දෙව්දත්තෙර
3. උපමාන පූර්ව පද විශේෂණ සමාසය - ගල්හිත, මල්හිනාව, කිසරතන
4. උපමාන උත්තර/ අපර පද විශේෂණ සමාසය - මුවපියුම, නරසිහ, පාතඹර
5. සංඛ්‍යා පූර්ව පද විශේෂණ සමාසය - නවදොර, පන්සිල්, දසපනත

# උසස් පෙළ සඳහා ග්‍රන්ථ නාමාවලිය

## (අ.පො.ස) උසස් පෙළ
## 12-13 ශ්‍රේණි - කෙටි සටහන්
**සිංහල මාධ්‍ය**

### විද්‍යා - ගණිත

- [ ] 12 සාමාන්‍ය තොරතුරු තාක්ෂණය
- [ ] 12-13 රසායන විද්‍යාව - 1
- [ ] 12-13 රසායන විද්‍යාව - 2
- [ ] 12-13 රසායන විද්‍යාව - 3
- [ ] 12-13 රසායන විද්‍යාව - 4
- [ ] 12-13 රසායන විද්‍යාව - 5
- [ ] 12-13 භෞතික විද්‍යාව - 1
- [ ] 12-13 භෞතික විද්‍යාව - 2
- [ ] 12-13 භෞතික විද්‍යාව - 3
- [ ] 12-13 භෞතික විද්‍යාව - 4
- [ ] 12-13 භෞතික විද්‍යාව - 5
- [ ] 12-13 ජීව විද්‍යාව - 1
- [ ] 12-13 ජීව විද්‍යාව - 2
- [ ] 12-13 ජීව විද්‍යාව - 3
- [ ] 12-13 ජීව විද්‍යාව - 4
- [ ] 12-13 ජීව විද්‍යාව - 5
- [ ] 12-13 ජීව විද්‍යාව - 6 (ක්‍රියාකාරී මානවයා)
- [ ] 12-13 ජීව විද්‍යාව - 7 (ක්‍රියාකාරී ශාකය)
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 1
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 2
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 3
- [ ] 12-13 කෘෂි විද්‍යාව - 4

### වාණිජ්‍යය

- [ ] 12 ගිණුම්කරණය
- [ ] 13 ගිණුම්කරණය
- [ ] 12 ව්‍යාපාර අධ්‍යයනය
- [ ] 13 ව්‍යාපාර අධ්‍යයනය
- [ ] 12 ආර්ථික විද්‍යාව
- [ ] 13 ආර්ථික විද්‍යාව - 1
- [ ] 13 ආර්ථික විද්‍යාව - 2

### කලා

- [ ] 12 සිංහල
- [ ] 13 සිංහල
- [ ] 12 දේශපාලන විද්‍යාව
- [ ] 13 දේශපාලන විද්‍යාව
- [ ] 12 ශ්‍රී ලංකා ඉතිහාසය
- [ ] 13 ශ්‍රී ලංකා ඉතිහාසය
- [ ] 12 ඉන්දියානු ඉතිහාසය
- [ ] 13 ඉන්දියානු ඉතිහාසය
- [ ] 12 භූගෝල විද්‍යාව
- [ ] 13 භූගෝල විද්‍යාව
- [ ] 12 බෞද්ධ ශිෂ්ටාචාරය
- [ ] 13 බෞද්ධ ශිෂ්ටාචාරය
- [ ] 12 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය
- [ ] 13 සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය

## Grade 12-13 - Short Notes
**English Medium**

- [ ] 12 Accounting
- [ ] 13 Accounting
- [ ] 12 Business Studies
- [ ] 13 Business Studies
- [ ] 12 Eeonomics

## 12-13 ශ්‍රේණි - ප්‍රශ්නෝත්තර
**සිංහල මාධ්‍ය**

- [ ] සාමාන්‍ය දැනීම
- [ ] 12 ගිණුම්කරණය - 1
- [ ] 12 ව්‍යාපාර අධ්‍යයනය
- [ ] 12 ආර්ථික විද්‍යාව

සියලු ම ශ්‍රේණි සඳහා කෙටි සටහන් සහ ප්‍රශ්න පත්‍ර පොත් අප සතුව තිබෙන අතර, මෙම ඕනෑම ග්‍රන්ථයක් වට්ටම් සහිත ව ඔබේ නිවසට ම ගෙන්වා ගත හැකි ය.